# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1658/6 - 2010 ජුනි 14 වැනි සඳුදා - 2010.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කළුතර නගර සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුව පිරවීම

අවසර නොලබා අනුගාමී රැස්වීම් තුනකට වැඩි සංඛ්‍යාවකට නොපැමිණ සිටීමේ හේතුවෙන් කළුතර නගර සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

කහටපිටියගේ නලින් මහේෂ් පෙරේරා නම් වූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කළුතර නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ජයන්ති වීරසිංහ මහත්මිය ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කළුතර නගර සභාවේ තේරීම්භාර නිලධාරි හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65 අ (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ජයන්ති වීරසිංහ මහත්මිය කළුතර නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,
තේරීම්භාර නිලධාරි,
කළුතර නගර සභාව.

2010 ජුනි මස 09 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කළුතර.

06 - 36

1A - G 12976 — 345 (2010/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.